සන්නස SANNASA

# දහත් වරගුව

චූටි මල්ලි

## ආදර්ශය

පාපන්දු වර්ල්ඩ් කප් එක පහුවෙලා දැං කාලයක් ගියානේ. ඒත් ඒ ගැන පොඩ්ඩක් ලියන්න හිතුවා. ඒ කාලේ ප්‍රධාන සිද්ධි දෙකක් වුණානෙ. කප් එකයි තායිලන්තෙ ගුහා කේස් එකයි. දෙකම මාරුවෙන් මාරුවට බැලුවා. ගුහාවෙ සීන් එක සීරියස් වුනාට මං නිදිවරාගෙන බැලුවෙ වර්ල්ඩ් කප් එක. ආසියානු කළාපයේ කාටවත් අර්ධ අවසාන වටයටවත් එන්න බැරිඋනත් ජපාන් නිසා අපි ආසියාතිකයේ කප් එක දිනුවා



වගේ ප්‍රසිද්ධ වුණා. ඒ ජපන් නරඹන්නන්ගේ විනීත බව හැදියාව නිසා. ගේම පැරදුනත් ආපු තැන කැත නොකර ලස්සනට තිබුණ විදිහට තියලා යන්න ඔවුන් කරපු කැපවීම ගැන ලියන්න වචන නෑ ලොක්කා.
එක අතකට ඒගොල්ලො කොහොමත් එහෙම තමයි. ක්ලීන් ද නීට්. ඒකනේ කුඩු පට්ටම් කරලා දාලා අළු කරලා දාලා අවුරුදු 30ක් 40ක් යන්න කලින් ලෝකෙම අල්ලන සයිස් එකට දියුණු වුණේ. ඒකට තමයි අපේ වචනෙන් චාරේ කියන්නේ. තමන් වගේම අනුන් ගැනත් හිතලා ආපු තැන කාල දාන්නැතුව ගේම ලොස් වුණත් ජාමෙ බේරගෙන ජපන්නු ආපහු ගියේ. අවවාදයට වඩා ආදර්ශය උතුම් කියලා පඬිවදනකුත් තියෙන බව අපි තමයි වැඩිම යන්ම දන්නෙ. ඒ උනාට අපේ වැඩ එහෙම නැහැනෙ. ඒකනෙ අපි තාමත් හතළිස් අටේ ඉන්නෙ.

## ආණ්ඩුවට සිග්නල් එකක්

අතුරු මැතිවරණයෙන් ලේබර් එකයි බිලුයි දෙන්නම ගොඩ ගියා. මෙහේ මිනිස්සුත් හරි අපූරු විදිහට ඡන්දෙ දෙන්නෙ. පත්තර වල අනාවැකි නම් බොහෝ වෙලාවට හරි යනවා. ඒත් මේ පාර ටිකක් අවුල් වගේ. මෙහේ දේශපාලනේත් යටිකූට්ටු වැඩ එමට තියෙනවා. චාන්ස් එක ආපු ගමන් දෙනවා නැතිවෙන්න. ටෝනි ඇබට්ගේ කතා බහෙන් ඒක පේනවා. ලොකු බිස්නස්කාරයන්ට දුන්න බදු සහනෙ ආණ්ඩුවට පාරා වළල්ලක් වෙලා වගෙයි පේන්නෙ. කොහොමත් මේ ආණ්ඩුව පෙනී සිටින්නේ ධනපති කොම්පැනිකාරයන් වෙනුවෙන් තමයි. ඒයාල අපට කියන්නෙ හාම්පුතාලට බදු සහන දුන්නම වැඩ කරන අපිට මරු කියලයි. මොකද හාම්පුතාට බදු කැපුවම ඒ අයගෙ සාක්කුට වැටෙන සල්ලි අපට බෙදල දෙනව කියලනෙ ආණ්ඩුව පෙන්නන්න හදන්නෙ. බයිලා තමයි. දැන් වැඩ කරමින් ඉන්න එවුන්ගෙත් රස්සා නැති කරලා හැම බඩුවක්ම චීනෙන් ගෙන්නන්න තමයි මේ කොම්පැණි කාරයන් ප්ලෑන් කරන්නෙ. ටෝනි ඇබට් කිව්ව වගේ ජනතාව ආණ්ඩුවට සිග්නල් එකක් දීලා තියෙ නවා. වමට දකුණුට හරවන එක ආණ්ඩුවේ වැඩක්.

## අපේ ඇදහීම

ෆේස් බුක් එක කියන්නෙ නවීන ලෝකයේ මාර නිර්මාණයක්. බොහොමයක් දුරට සමාජය විනිවිද දකින්න හැකි නියම කැඩපතක් ඒක. බහුතරයක් මිනිස්සු අනවබෝදයෙන් ෆේස්බුක් එක සෘණාත්මක විදිහට පාවිච්චි කළත් ධණාත්මක විදිහට ඒක පාවිච්චි කරන නිර්මාණාත්මක මිනිස්සු දැකීම සතුටක්. දුක ඒක එහෙම වෙන්නෙ ඉඳලා හිටලා නිසා. හරි අපූරු දේවල් මේක හරහා මිනිස්සු කරනවා. මිනිස්සු හිතන පතන විදිහ මිනිසුන්ගෙ දැක්ම අවබෝධය ගැන සමීක්ෂණ කරන්නත් ෆේස්බුක් එක හරහා පුලුවන්.

පහුගිය දවසක තරුණයෙක් හරි අපූරු වැඩක් කරලා තිබුනා. මේක තනිකරම නිර්මාණයක් බව තේරෙනවා. ඒත් ඔහු ඒ හරහා ලොකු පණිවුඩයක් දෙනවා. ඔහු ඡායාරූප දෙකක් දාලා මත විමසුමක් කරනවා. මගේ ලෝකයේ වීරයා යන මාතෘකාව යටතේ. ෆොටෝ දෙකේ ඉන්නෙ බුදුන්වහන්සේ හා මහින්ද. ප්‍රතිඵලය හරිම අපූරුයි. බුදුන්ට ඡන්ද 47% යි මහින්දට 53% යි. පිස්සු හැදෙනවා. සැබෑ යථාර්ථයත් එයම වෙන්න පුලුවන්. අපි දැන් අධ්‍යාත්මිකව ඒ තරම් ඉදිරියට ගිහින්. දැන් අපි අදහන්නේ පට්ට පල් දේශපාලුවන්. මේක දැක්කම අඬනවද හිනාවෙනවද කියලා චූටි මල්ලිට හිතාගන්න බැරිවුණා.

## ජූලි මතක

බියකරු අසුන්දර මතක ගණනාවක් අපේ හදවත් තුළ සදහටම ඉතිරි කරපු කලු ජූලියට අවුරුදු 35ක් ගතවුණා. ඒ ගැන අන්තර්ජාලෙත් පුවත්පත් වලත් සෑහෙන ලිපි ප්‍රමාණයක් පළවෙලා තියෙනවා දැක්කා. ජූලි සිද්ධියත් එක්ක අපි දකින්නේ අහන්නේ පාරවල් වල දැවුණ මළමිණී සහ කුඩු කර ගිනි තැබූ ගෙවල් දොරවල් ගැනම පමණයි. ඒත් ඒ හා බැඳුණ අනුවේදනීය අතුරු කතා නම් කොපමණ තියෙනවද? ජූලියත් එක්ක වෙනස්වුණ ජීවිත වල මතක



තවමත් අපේ හදවත් පාරනවා. ජාතිවාදී කෝලාහල යන්න කොතරම් භයංකර දැයි නව පරම්පරාව බිඳක් හෝ අවබෝධ කරගෙන නැති බව පැහැදිලිව පේනවා. දැන් දැන් ඇතිවන විවිධාකාරයේ ජාතිවාදී ගැටුම් අවුලන්න ඉස්සරහට එන්නෙ මේ ඊයෙ පෙරේදා දැලි රැවුල ආපු කොල්ලන් වීම ඒක පැහැදිලි කරනවා. අලුත්ගම ගිනිපුපුරක් නම් ජූලිය යනු ගිනි මැලයක් බව නව පරපුරට අවබෝධ කර දෙන්නේ කවුද? කෙසේද? ඒ ගැන දුකක් චූටි මල්ලිගෙ හදවතේ නිරතුරුව තියෙනවා. මාර දුකයි ඇත්තටම.

## මරණීය දඬුවම

මරණ දඬුවමට අපි විරුද්ධයි. ඒක ආපහු ක්‍රියාත්මක කරන්න ලෝකේ නැති කාරණා කියන්න පුලුවන්. පක්ෂ අය එකක් කියයි. විපක්ෂ අය තව එකක් කියයි. ඒ මැද් දේ ඉන්න ජහමනයා වන අපි නම් එකහෙළාම සහසුද් දෙන්ම මේකට විරුද්ධයි. අපේ ඉතිහාසයේ ඉඳලම ලෝකෙ කොහෙවත්ම නැති දඬුවම්නෙ අපට තිබුණෙ. කපනවා, පෙති ගහනවා, දෙපලු කරනවා, ඇතුන් ලවා පාගවනවා, දියේ ගිල්ලනවා, වංගෙඩි වල දාලා කොටනවා, උල ඉන්දනවා. මිනිස්සු මරන්න මොනවද අපි නොකළේ? මේ ක්‍රම වලට මරපු හැම මිනිහෙක්ම වැරදි කරපු අයද? යාන්තං සුද්ද ආවට පස්සෙ රාජාණ්ඩුව නැතිවෙලා අර තිරශ්චීන ක්‍රම නැතිවෙලා එල්ලන තැනට ආවා. ඒකත් ටිකෙන් ටික නැති වුණා. ඒක නැවතුණේ මිනිස්සු විදිහට ලෝකෙ මිනිස්සු හිතන විදිහ වෙනස් වෙන්න ගත්තට පස්සෙ. මේ වෙනස්වීම නිසා මරණ දණ්ඩනය නැතිවීමේ වාසිය දූෂිත බලවේග ලබාගත්තත් එහි ප්‍රතිඵලයක් විදිහට නැවතත් වටයක් ගිහින් අර මුලටම එන්න මිනිස්සු හැටියට අපට පුලුවන්ද? මරණ දණ්ඩනය ගේන්න හදන අය කියන විදිහට මේක ගේන්න හදන්නෙ කුඩු ව්‍යාපාරය නවත්තන්නලු. පොලීසිය නාකොටික් එක අරක මේක සියල්ලම තියෙද්දි කුඩු ව්‍යාපාරය නවත්තන්න බැරි නම් මරණ දඬුවම දීලා ඒක කරන්න පුලුවන්ද? පොලිසියත් එක්ක තරහ අහිංසක මිනිස්සුන්ව කුඩු පැකට් දාලා අල්ලගත්ත අවස්ථා කොයි තරම්ද? මේ අහිංසකයන් මැරුවොත් ඒක සහගහන අපරාධයක් වෙයි. කරන්න තියෙන්නෙ අවශ්‍ය අංශ වලට නිසි බලතල දීමත් නිදහසේ ක්‍රියාත්මකවෙන්න ඉඩ දීමත්ය කියන කාරණය බලධාරීන්ට නොපෙනීම අවාසනාවක්.

